කරන්න පුළුවන්. නමුත් එය අද ඔහේ අයාලෙ යනවා. වේදිකාවට නැගලා ගිරිය පුප්පලා කෑගහන එකත් කලාවක් වෙලා. ගී ගයන්න බැරි අය ගී කියනවා. නටන්න බැරි අය නටනවා. වයන්න බැරි අය වයනව. ඒ අය කලාවට ආදරේ නම් එයට අර්ථයක් දෙන්න අවශ්‍යනම් එය අධ්‍යයනය කළ යුතුයි. කාලයක් අපරටේ මැණික් මුදලාලිල චිත්‍රපටි කළා. ඒ කලාව දැනගෙන නෙමෙයි. සල්ලි තියෙන නිසා. අද වැඩිපුරම සිංහල සී ඩී තැටි ගී තැටි නිර්මාණය වෙන්නෙ විදෙස් රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගෙන් නමුත් ඒවට පැවැත්මක් නැහැ. කලාව සෞන්දර්ය විෂයක්. සුන්දරත්වය හා බැඳී පවතින දෙයක් අද කුමක් හෝ ශ්‍රී ලාංකික කලාවක් කියල, හැම සතියෙම මොකක් හරි තියෙනවා. අප රටෙනුත් ශිල්පීන් ඇවිල්ලා නොයෙක් ප්‍රසංග පවත්වනවා. නමුත් කලාවේ ප්‍රවර්ධනයක් දකින්න නැහැ. ඕකෙන් වෙන අහිතකරම ප්‍රතිඵලය තමයි අපෙන් මෙරට බිහිවෙන අළුත් පරපුර හිතන පතන දේ. අපේ දරු පරපුරත් අපේ සංස්කෘතිය හඳුනගන්නෙ මොළේ කුරුවල් කරගෙන. වේදිකාවට නැගලා ලයිට් පත්තු කරන එකත් කලාවක් වෙලා. තාක්ෂණය කලාව තම උගත්කමත් එක්ක පටලවගෙන. කලාවට තාක්ෂණය

# කුට්ටම් පොකුණ



## ලක්ෂ්මන් කොඩිතුවක්කු

එවුන් හිතන්නෙ සිංහල අවුරුද්දට රතිඤ්ඤා වෙනුවට තුවක්කුව පත්තු කරන්න පුළුවන් කියලා. හරවත් දේ කාලයක් ගිහිල්ලා හරි ප්‍රේක්ෂකයො අවබෝධ කරගන්නවා. රේඛාව චිත්‍රපටිය සාර්ථක නිර්මාණයක් වුනත් ප්‍රේක්ෂකයන්ගෙ පැත්තෙන් අසාර්ථක වුණා. නමුත් පසු කාලයක රේඛාව චිත්‍රපටිය හොය හොයා ප්‍රේක්ෂකයො නැරඹුවා. පසු කාලයක හරි හරවත් නිර්මාණ ඔවුන් වැළඳ ගන්නවා. ඒ නිසා අපි බුද්ධිමත් වුනොත් ප්‍රේක්ෂකයොත් බුද්ධිමත් නැත්නම් අනාථයි. අද මෙරට ප්‍රේක්ෂකයො ප්‍රෙක්ෂකාගාරයෙන් ඈත්වෙමින් පවතින්නෙ ඒ කරුණු නිසා. නැතිව ප්‍රේක්ෂකයෝ මෝඩයො නොවෙයි.



***නමුත් මෙවැනි කුඩා ශ්‍රී ලාංකික ප්‍රජාවක් සිටින රටක ඔවැනි ප්‍රසංගයක් කිරීමත් ඉතාම අසීරු කටයුත්තක්. ප්‍රායෝගිකව ඔබ බලාපොරොත්තුවන දේ කිරීමට විශාල කැපකිරීමක් කරන්න ඕනෙ. ඔබතුමා මෙයට දෙන විසඳුම කුමක්ද ? ගොඩනැගිය හැකි ක්‍රමවේදය කුමක්ද ?***

ජන කවියක් තියෙනවා මෙහෙම

කඩුල්ලේ තරම දැනගෙන වැට බඳිනූ
ගොඩැල්ලේ තරම දැනගෙන ලිඳ කපනූ
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනූ
තමන්ගේ තරම දැනගෙන දවස යනූ

අවශ්‍යමයි කියලා අද අපි හිතුවත් තාක්ෂණය නැති කාලෙත් මිනිස්සු කලාව රසවින්ද කලාව සංස්කෘතිය හා බැඳුණු කිසිදා වෙන් කළ නොහැකි බැම්මක්. සංස්කෘතිය කියල කියන්නේ කුඩා බීජයකින් රෝපණය වූ විශාල ගහක්. අතු විහිදුනු එල හටගන්න නොමැරෙන රුකක්. සිසිල දෙන සෙවනක්. අපි අපේ සංස්කෘතිය සභ්‍යත්වය නිවැරදිව හඳුනාගත යුතුයි.

***ඔබතුමා එසේ කීවත් මෙරට සිටින කලා ශිල්පීන් හැඩ ගැහිල ඉන්නෙ ප්‍රේක්ෂකයෝ ඉල්ලන දේ දෙන්න. කලාව කියන්නෙ සිනහව කියල හිතන ඒවා බලාගෙන නිර්මාණ සොයාගෙන එන, බොහෝ පිරිසක් මෙහෙ ඉන්නවා. කලා ශිල්පීන් වගේම අපිට බුද්ධිමත් ප්‍රේක්ෂක පිරිසක් අවශ්‍යයි කියලා මම කිව්වොත්***

බුද්ධිමත් ප්‍රේක්ෂකයො කොහෙත් අඩුයි. අප රටේ බුද්ධිමත් ප්‍රේක්ෂකයො බොහෝම අඩු රටක්. අපි දැනගන්න ඕනෙ අපේ කලාවෙන් ප්‍රේක්ෂකයො බුද්ධිමත් කරන්න. ගල් යුගයේත් ආදි වාසීන් කලාව රස වින්දා. ගිනිමැල පත්තු කරගෙන සතෙක් එලාගෙන ගී කියමින් කැලෑවේ නැටුවෙ තමන්ට සභ්‍යත්වයක් සංස්කෘතියක් නැති කාලේ. නමුත් අද සමහර බොළඳ නිර්මාණවලට වඩා ඒවා කොතරම් රසවත්ද ?. ඒත් ඔවුන් බුද්ධිමතුන්ද ?. ප්‍රේක්ෂකයන් ඉල්ලන දේ දීම කලාව නෙවෙයි. ඒකට හොඳම උදාහරණය තමයි මා සිඩ්නිවල දුටුව බක්මහ රංගන ප්‍රසංගය. ඒක තියන්න තිබ්බෙ වෙන මාසෙක. ඒක හරියට ප්‍රාසාංගික කලාව නොහඳුනන පිරිසක් කළ ආධුනික ප්‍රසංගයක් ලෙසයි මා නම් දුටුවේ. වසන්ත මංගල්‍යය පිළිබඳ කිසි ලකුණක් එහි නැහැ. මෙතරම් කාලයක් මුදලක් ශ්‍රමයක් වැය කරලා ප්‍රේක්ෂකයන්ට අන්තිමට එයින් ඉතිරි කළ දෙයක් නැහැ. සිංහල දෙමළ සිරිත් විරිත් චාරිත්‍ර ප්‍රසංගයක්. වේදිකාව පුරාම දුටුවේ වෙනත් අනම් මනම්. එහි වරද තමයි බක්මහ අවුරුදු, වසන්ත සැණකෙළි පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය නොකර අඳුරේ අතපත ගාමින් ක්ෂණික ආප්ප වාගේ කලාව කිරීම. සංහිඳියාව සාමය වෙනුයට වේදිකාවට තුවක්කුවක් ගෙනැල්ල පොඩිදරුවන් ඉස්සරහ කොකා ගැස්සුවහම පොඩි

ශිල්පීය දක්ෂතාවයන් ඇති නව නළු රසය හඳුනන පිරිසක් මේවට සම්බන්ධ විය යුතුයි. හාස්‍ය රසය කියන්නෙ කුණුහරුප කියන එක නෙමෙයි. කලාව පිළිබඳව සම්මන්ත්‍රමාලාවක් පවත්වල ඒ පිළිබඳ දැනුම ඇති අයගෙන් උපදෙස් ලබාගෙන, නිවැරදි වැඩ සටහනක් අනුව නිර්මාණ කතිකාවක් ගොඩනැගිය යුතුයි. රඟන්න වයන්න හැකියාව ඇති අය මේ දෙවියන්ගේ භාෂාවෙන් (සංගීතය, කලාව) නිසි සැලැස්මක් අනුව ඵල ප්‍රයෝජන ගත යුතුයි. නැත්නම් කලාවට වෙන්නෙ අපහාසයක්. කලාවෙන් අසීරු දේවල් නිර්මාණය කළ හැකියි. සුදුසු දේ සුදුසු තැන යෙදිය යුතුයි. දක්ෂයා ඉන්නවා. ප්‍රයෝජන නොගැනීමයි වැරැද්ද. සීනිත් හකුරුත් පැණි රසයි. ඒත් අපි හඳුනගන්න ඕනෙ සීනි රසයයි හකුරු රසයෙයි ඇති වෙනස.

***දැන් ඔබතුමා ළඟත් ශිල්පීය ඥානය හදාරණ බාල වැඩිහිටි පිරිසක් ඉන්නවා. ඔබතුමා ඔවුන්ට ලබාදෙන දැනුම මෙරට ප්‍රජාවට දැක ගැනීමට අවස්ථාවක් ලබාදෙන දිනය කවදද?***

මගෙන් ශිල්පය හදාරන දුවා දරුවන්ගේ ප්‍රසංග්‍රයක් ළඟදීම පැවැත්වීමට බලාපොරොත්තු වෙනවා. මේ දිනවල ඒ කටයුතු සංවිධානය කරගෙන යනවා. ඒ දිනය ළඟදීම සන්නසට මං දැනුම් දෙන්නම්. මම ළඟ ඇති සියලුම සංගීත ඥානය මං ඔවුන්ට ලබා දෙනවා. ඒ පිළිබඳව ආශාවක් උනන්දුවක් දක්වන පිරිසක් වේ නම් ඔවුන්ට ද එයට සම්බන්ධ වීමට පුළුවන්. ඇත්තෙන් ම මා ළඟට එන දරුවන්ගේ හැකියාව පිළිබඳව මා තෘප්තිමත්. ඔවුන් දක්ෂයි. ඔවුන් නිවැරදි මාවතකට යොමු කිරීම අපි සතුයි. යම් කිසි සංගීත ඥානයක්, හැකියාවක් ඇති අයෙක් ඇත්නම් ඔවුන්ටද මෙම ප්‍රසංගයට සම්බන්ධවීමට පුළුවන්. මට දෙන්න පුළුවන් උපරිමය මං ඔවුනට ලබාදෙනවා.


YSL
Migration Services

ශ්‍රී ලාංකික ඔබට
සොඳුරු සේවය

We specialise in

General Skilled Migration Visas
Applications for State Migration Plans
Onshore|Offshore Partner Visas
Sponsored Visitor|Tourist Visas
Student Visas
Parent Visas

Lead Design House

Yashodhara Sarachchandra Liyanaarachchi
(Registered Migration Agent)
MARN: 0746956
0430 359 006

26 Sallybrook Circuit, Narre Warren, VIC 3805

Now also available for consultation at
Bundoora
(Close to Latrobe university , RMIT and NMIT)
6 Mat Rush Avenue, Bundoora, VIC 3083
Tel: 03 9467 4468
yasho@yslmigration.com

MIGRATION AGENT
REGISTERED
mara.com.au
REGISTRATION NUMBER 0746956

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA